| | | |
|---|---|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** | | |
| **පළමු වාර පරීක්ෂණය - 2018** | | |
| **චිත්‍ර කලාව - I** | **12 ශ්‍රේණිය** | **කාලය පැය තුනකි** |

- **මෙමප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතයි.**

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් තෝරන්න.**


A


B


C


D


E

1. A අක්ෂරයෙන් දැක්වෙන්නේ ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍රයකි. එය ''දුනුවායා'' නමින් හඳුන්වයි. එය හමුවන්නේ,
   (1) තන්තිරිමලේ ගුහාවෙනි.
   (2) බිල්ලෑව ගුහාවෙනි.
   (3) වෙට්ටබුගල ගුහාවෙනි.
   (4) දොරවක කන්ද ගුහාවෙනි.
   (5) රාජගල්කන්ද ගුහාවෙනි.
   (................)

2. B අක්ෂරයෙන් දැක්වෙන්නේ සාංචි ස්තූපයයි. එය,
   (1) බින්දුසාර රජුගේ නිර්මාණයකි.
   (2) චන්ද්‍රගුප්ත රජුගේ නිර්මාණයකි.
   (3) අශෝක රජුගේ නිර්මාණයකි.
   (4) කණිෂ්ක රජුගේ නිර්මාණයකි.
   (5) I රාජ රාජ රජුගේ නිර්මාණයකි.
   (................)

3. සඳකඩ පහණක කොටසක් C අක්ෂරයෙන් දැක්වෙයි. එය අයත්වන යුගය වන්නේ,
(1) පොළොන්නරු යුගය
(2) අනුරාධපුර යුගය
(3) මහනුවර යුගය
(4) ගම්පල යුගය
(5) කෝට්ටේ යුගය
(...............)

4. D අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
(1) මිසර චිත්‍රයකි.
(2) ග්‍රීක මැටි බඳුන් චිත්‍රයකි.
(3) සාම්ප්‍රදායික වාටි මෝස්තරයකි.
(4) ගෝතමී විහාරයේ වාටි මෝස්තරයකි.
(5) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මැටි බඳුන් චිත්‍රයකි.
(...............)

5. E අක්ෂරයෙන් දැක්වෙන මුරගල හමුවන ස්ථානය වන්නේ,
(1) රත්න ප්‍රසාදය
(2) බිසෝමාලිගය
(3) ශ්‍රී මහා බෝධිය
(4) ථූපාරාම ස්ථූපය
(5) පොළොන්නරු වටදාගෙය
(...............)

- **ප්‍රශ්න අංක 6 - 15 තෙක් වඩාත් යෝග්‍ය පිළිතුරු තෝරන්න.**

6. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර අතර අඩි 17ක් දිග බයසන් ගව රුව හමුවන්නේ,
(1) ලැස්කෝ ගුහාවෙනි.
(2) ඇල්ටමීරා ගුහාවෙනි.
(3) පොන්ඩිගෝම් ගුහාවෙනි.
(4) ප්‍රංශයේ නියෝ ගුහාවෙනි.
(5) ස්පාඤ්ඤයේ කොගුල් ගුහාවෙනි.
(...............)

7. රන්කොත් වෙහෙර ස්තූපයේ හතරැස් කොටුවේ දක්නට ලැබෙන්නේ,
(1) සූර්යයා සංකේතවත් කරමින් චක්‍ර කීපයකි.
(2) ඉරහඳ සංකේතයකි.
(3) දේවතා රූප කිපයකි.
(4) නෙළුම් මල් හතරකි.
(5) මෙහි කිසිම රූපයක් දක්නට නොමැත.
(...............)

8. දැනට ලංකාවේ හමුවන ''වාහල්කඩ'' අතරින් පැරණිම සහ කලාත්මක හොඳම වාහල්කඩ හමුවන්නේ,
(1) මිහින්තලේ කණ්ඨක ස්තූපයෙනි.
(2) මිරිසවැටිය ස්තූපයෙනි.
(3) අභයගිරි ස්තූපයෙනි.
(4) රුවන්වැලි සෑ ස්තූපයෙනි.
(5) ජේතවනාරාම ස්තූපයෙනි.
(...............)

9. මිසරයේ පර්වත හාරා ඉදිකළ දේවස්ථානයකි.
(1) ලැක්සෝ
(2) ඉඩ්පු
(3) අබුසිම්බල්
(4) කානැක්
(5) පාතිනන්
(...............)

10. ග්‍රීක මූර්ති අතර ''හර්මිස් හා ඩයෝනිෂියස්'' මූර්තිය නිර්මාණය කරන ලද්දේ,
(1) මයිරන්
(2) ලිසිපස්
(3) පීඩියස්
(4) පැක්සි ටැලස්
(5) පොලික් ලීටස්
(...............)

11. ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්තියකි,
(1) කවපෙත්ත විසිකරන්නා
(2) වීනස් දී මෙලෝ
(3) ලැවකුන්
(4) දුනුවායා
(5) ජයග්‍රහණයේ දෙවඟන
(...............)

12. මිසර මූර්ති අතර පාරාවෝ රජවරුන්ගේ බල පරාක්‍රමය පෙන්වීම සඳහා ඉදිකළ මූර්තියකි,
(1) කාෆිරේ
(2) ස්ක්‍රයිබ්
(3) නෙපර්ටිටි
(4) රහෝටෙප් හා නෝප්‍රෙට්
(5) ස්පින්ක්ස්
(...............)

13. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර කුඩා දරුවෙකුගේ මුද්‍රිත පා සලකුණු දක්නට ලැබෙන ගුහාව,
(1) කොගුල් ගුහාව
(2) නියෝ ගුහාව
(3) ලැස්කෝ ගුහාව
(4) පොන්ඩි ගෝමේ ගුහාව
(5) චෝවේ/ෂොවේ ගුහාව
(................)

14. සාංචි තොරණ කැටයම් අතර ''සංකස්ස පුර වැඩීම'' නමැති කැටයමේ බුදුන් වහන්සේ සංකේතවත් කළේ,
(1) සිරිපතුල
(2) ධර්ම චක්‍රය
(3) ආසනය
(4) බෝධිය
(5) ඡත්‍රය
(................)

15. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ මූර්ති අතර ලෝහ මාධ්‍යයෙන් නිර්මාණය කර ඇති මූර්තියකි.
(1) නලඟන
(2) කවන්ධ රුව
(3) පූජක රුව
(4) මව් දෙවඟන
(5) නර්තන විලාසයක් දක්වන කවන්ධ රුව
(................)

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර F, G, H, I, J යන අක්ෂර ඇසුරින් තෝරන්න.**


F


G


H



I


J

16. F අක්ෂරයෙන් දැක්වෙන්නේ මිසර මූර්තියකි. එය හඳුන්වන්නේ,
(1) කාෆරේ නමිනි.
(2) රහොටෙප් නමිනි.
(3) ස්ක්‍රයිබ් නමිනි.
(4) නෙෆර්ටිටි නමිනි.
(5) නෝෆ්‍රෙට් නමිනි.
(................)

17. G අක්ෂයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කරන ලද ශිල්පියා,
(1) A.C.G.S. අමරසේකර
(2) ඩේවිඩ් පේන්ටර්
(3) ස්ටැන්ලි අබේසිංහ
(4) H.A. කරුණාරත්න
(5) J.A.D. පෙරේරා
(................)

18. H අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) මිසර රූපාක්ෂර කැටයමකි.
(2) හින්දු දේවස්ථානයක කැටයමකි.
(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රාවකි.
(4) ටෙරාකොටා මූර්තියකි.
(5) භාරුත් ගල් වැටේ කැටයමකි.
(................)

19. I අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) කුඩා දරුවෙකුගේ සිතුවමකි.
(2) ලාංඡනයකි.
(3) රූපාක්ෂරයකි.
(4) මුද්‍රාවකි.
(5) ගාන්ධාර රන් කාසියකි.

(...............)

20. J අක්ෂරයෙන් දැක්වෙන කැටයම,

(1) මිසර දේවස්ථාන කැටයමකි.
(2) අශෝක ස්තම්භ කැටයමකි.
(3) වාහල්කඩ කැටයමකි.
(4) සාංචි තොරණ කැටයමකි.
(5) භාරුත් ගල් වැටේ කැටයමකි.

(...............)

- **ප්‍රශ්න අංක 21 සිට 30 තෙක් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. රතු මල් යොදා ඇති චිත්ත මෝස්තරයක එහි පසුබිම සඳහා ඔබ යොදන විරුද්ධ වර්ණය වන්නේ,

(1) කළු
(2) නිල්
(3) කොළ
(4) දම්
(5) කහ

(...............)

22. ''ටෙම් පෙලේට්''චිත්‍රයක් නිර්මාණය කිරීම සඳහා සුදුසුම මාධ්‍ය වන්නේ,

(1) දිය සායම්
(2) තෙල් සායම්
(3) කුඩු සායම්
(4) පැස්ටල්
(5) පාට පැන්සල්

(...............)

23. පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු ප්‍රධාන ම ලක්ෂණය වනුයේ,

(1) පැතලි වර්ණ භාවිතා කිරීම.
(2) පණිවුඩයේ වේගවත් බව හා නිරවුල්ව සංකේතවත් වීමයි.
(3) දිදුලන වර්ණ හා ස්වභාවික හැඩ භාවිතය
(4) හැඩ වෙන් වෙන්ව වේගවත් ව රේඛා යෙදීමයි.
(5) සමතල මුද්‍රණ ක්‍රමයට මුද්‍රණය වීමයි.

(...............)

24. ලිතෝ මුද්‍රණය යනු,

(1) තිර රාමු ක්‍රමයට මුද්‍රණය කර ගැනීමයි.
(2) උත්තල ක්‍රමයට මුද්‍රණය කර ගැනීමයි.
(3) අවතල ක්‍රමයට මුද්‍රණය කර ගැනීමයි.
(4) සමතල මුද්‍රණ ක්‍රමයට මුද්‍රණය කර ගැනීමයි.
(5) වර්ණ ඡායාරූප ඒ සැටියෙන්ම මුද්‍රණය කිරීමයි.

(...............)

25. කලා කෘතියක් ඇගයීමේදී,

(1) මාධ්‍ය තුළින් තේමාව ප්‍රකාශව ඇති ආකාරය හා එහි අපූර්වත්වය
(2) තේමාවේ ඇති හරවත් බවයි.
(3) මාධ්‍ය හැසිරවීමේදී ශිල්පියා දක්වා ඇති කුසලතාවයයි.
(4) සිද්ධාන්ත භාවිතයේ ඇති යෝග්‍යතාවයයි.
(5) වර්ණ ප්‍රභේද භාවිතයේ යෝග්‍යතාවයයි.

(...............)

26. ජේ.ඩී.ඒ. පෙරේරා නම් ශිල්පියාගේ නිර්මාණයකි,

(1) විරුකියාව
(2) ජෙරුසෙලමට ඇතුළු වීම
(3) නලඟන
(4) සඳ පායා
(5) කුඹල් හල

(...............)

27. ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර ''ඇතා සහ ඇත්පැටවා'' දැක්වෙන රූපය හමුවන්නේ,
(1) දොරවක ලෙන් ගුහාවෙනි.
(2) බිල්ලෑව ගුහාවෙනි.
(3) වෙට්ටඹුගල ගුහාවෙනි.
(4) තන්තිරිමලේ ගුහාවෙනි.
(5) බටදොඹලෙන ගුහාවෙනි.
(................)

28. ථූපාරාම ස්තූපය මුල්ම කාලයේ තිබූ හැඩය වන්නේ,
(1) ධාන්‍යාකාර
(2) ඝණ්ඨාකාර
(3) අම්ලාකාර
(4) ඝඨාකාර
(5) බුබ්බුලාකාර
(................)

29. අනුරාධපුර යුගයට අයත් පැරණිම ''ආසන සරය'' හමුවන්නේ,
(1) හල්මිල්ලවැටිය ගමෙන් ය.
(2) නිල්ලක් ගමින් ය.
(3) තොළුවිල ගමෙන් ය.
(4) පන්කුලිය ගමෙන් ය.
(5) රිටිගල ගමෙන් ය.
(................)

30. පධානඝර නිර්මාණය කරන ලද්දේ,
(1) භික්ෂූන් වහන්සේලාට පෝය කර්ම කිරීම සඳහා ය.
(2) භාවනායෝගී භික්ෂූන් වහන්සේලා සඳහා ය.
(3) ආරාමවාසී භික්ෂූන් වහන්සේලා සඳහා ය.
(4) භික්ෂූන් වහන්සේලාට වැඳුම් පිදුම් කිරීම සඳහා ය.
(5) බුදු පිළිම තැන්පත් කිරීම සඳහා ය.
(................)


- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු යන අක්ෂර ඇසුරින් තෝරන්න.**


K


L


M


N


O

31. K අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) රාම්පූර්වා ස්තම්භ ශීර්ෂයයි.
(2) නන්දගර් ස්තම්භ ශීර්ෂයයි.
(3) සාරානාත් ස්තම්භ ශීර්ෂයයි.
(4) සාංචි තොරණේ උඩ ඇති ශීර්ෂයයි.
(5) භාරුත් ගල් වැටේ උඩ ඇති ශීර්ෂයයි.
(................)


32. L අක්ෂරයෙන් දැක්වෙන සිතුවම අඳින ලද ශිල්පියා,
(1) අමරසේකර
(2) M. සාර්ලිස්
(3) ඩේවිඩ් පේන්ටර්
(4) G.S. ප්‍රනාන්දු
(5) සෝලියස් මැන්දිස්
(................)

33. M අක්ෂරයෙන් දැක්වෙන මිසර සිතුවම හමුවන්නේ,
(1) අබුසිම්බල් දේවස්ථානයෙනි.
(2) ගියෝෆ් පිරමීඩයෙනි.
(3) මීඩම් හි සොහොන් ගැබකිනි.
(4) තිබස් හි සොහොන් ගැබකිනි.
(5) කාෆරේ පිරමීඩයෙනි.
(................)

34. N අක්ෂරයෙන් දැක්වෙන්නේ සාංචි තොරණේ කැටයමකි. එය,
(1) බුදුන් වහන්සේ සංකස්ස පුර වැඩීම.
(2) ජවදත්ත ජාතකය
(3) ජටිල දමනය
(4) අශෝක රජු ශ්‍රී මහා බෝධිය වැඳීම.
(5) අශෝක රජු කෝණාගම මුනිඳුන්ගේ සෑය වැඳීම.
(................)

35. ප්‍රතිසංස්කරණය කිරීමට පෙර ස්තූපයක් O අක්ෂරයෙන් දැක්වේ. එය,
(1) රුවන්වැලි සෑ ස්තූපයයි.
(2) ජේතවන ස්තූපයයි.
(3) අභයගිරි ස්තූපයයි.
(4) මිරිසවැටිය ස්තූපයයි.
(5) රන්කොත් වෙහෙර ස්තූපයයි.
(................)

- **ප්‍රශ්න අංක 36 - 40 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.**



36. මෙම චිත්‍රය දක්නට ලැබෙන්නේ,

(1) කැළණි විහාරයේ
(2) ගෝතමී විහාරයේ
(3) බෙල්ලන්විල විහාරයේ
(4) මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ
(5) බොරැල්ල සියලු ශාස්තෘවරුන්ගේ දෙව් මැදුරේ

(...............)

37. මෙම චිත්‍රය නිර්මාණය කරන ලද්දේ,

(1) ජෝජ් කීට්
(2) සෝලියස් මැන්දිස්
(3) ඩේවිඩ් පේන්ටර්
(4) එම්. සාර්ලිස්
(5) සෝමබන්දු විද්‍යාපති

(...............)

38. මෙම චිත්‍රය තුළින් ප්‍රකාශ වන්නේ,

(1) කඳුකර පරිසරය සහිත භූමි දර්ශනයක් නිරූපිතය.
(2) රෝගී පුද්ගලයෙකුට උපස්ථාන කරන්නෙකු නිරූපිතය.
(3) පීඩිත පන්තියේ සමාජ සමාජ දරිද්‍රතාව නිරූපිතය.
(4) සැබෑ සිද්ධියක් සිතුවමින් නිරූපිතය.
(5) හිරු බැස යන අවස්ථාවක් නිරූපිතය.

(...............)

39. ශිල්පියා මානව රූප නිර්මාණකරණයේදී දක්වා ඇති කුසලතාවය වන්නේ,

(1) රූපවල කායික ව්‍යුහ ලක්ෂණ නිවැරදිව භාවිතා වීම.
(2) ඝනිකවාදී කලාවේ ආභාෂය ලබා මානව රූප නිරූපණය
(3) මානව රූප ශෛලීගත සම්ප්‍රදායෙන් නිරූපණය
(4) විස්තරාත්මක ගති ලක්ෂණ සහිත මානව රූප නිරූපණය
(5) මානව රූප තේජාන්විත නිරූපණය

(...............)

40. මෙම සිතුවමේ සුවිශේෂී ලක්ෂණය වන්නේ,

(1) දේශීය ශෛලිගත චිත්‍ර සම්ප්‍රදායේ ආභාෂය ලබා තිබීම.
(2) යුරෝපීය ඝනකවාදී කලාවේ ආභාෂය ලබා තිබීම.
(3) කිතු ආගමික තේමාවක් වුවද ස්වදේශික පුද්ගල හා පරිසර ලක්ෂණ නිරූපණය කර තිබීම.
(4) ජ්‍යාමිතික හැඩ හා වර්ණ ප්‍රභේද භාවිත කර තිබීම.
(5) රේඛා භාවිතය අවමව දක්වා තිබීම.

(...............)

## <u>II කොටස</u>

- **II කොටස අනු කොටස් තුනකි. එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරා බැගින් තෝරා ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**

### අ කොටස
### චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය
### ශ්‍රී ලංකාව

1. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී ශ්‍රී ලාංකීය කලාකරුවා විවිධ යුගවලදී විවිධ වෙනස්කම් ඇති කරමින් ප්‍රතිමා නෙළීම කළහ.

(i) අනුරාධපුරයේ කලා ප්‍රතිමාවලට වඩා මහනුවර යුගයේ කළ ප්‍රතිමාවල දැකිය හැකි වෙනස්කම් 04ක් ලියන්න. (ල. 04)

(ii) අනුරපුර මහමෙව්නා උයනේ සමාධි බුද්ධ ප්‍රතිමාව තුළ දක්නට ඇති කලා ලක්ෂණ පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)

(iii) පොළොන්නරු යුගයේ ඉදිවූ සුවිසල් ප්‍රතිමා පෙළක් හමුවන්නේ ගල් විහාරය හෙවත් උත්තරාරාමයෙනි. එම ප්‍රතිමා පෙළ පිළිබඳව ඇගයීමක් කරන්න. (ල. 10)

2. අතීතයේ විසූ මානවයාගේ සෞන්දර්ය ප්‍රකාශනය පිළිබඳ තොරතුරු රැසක් ප්‍රාග් ඓතිහාසික යුගයේ ගුහා චිත්‍ර ඇසුරින් හමුවේ.

(i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ගුහා සිතුවම් දක්නට ලැබෙන ස්ථාන 04ක් නම් කරන්න. (ල. 04)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිතුවම් නිර්මාණය සඳහා පදනම් වූ වස්තු විෂය පැහැදිලි කරන්න. (ල. 06)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් සිතුවම් ඇඳීමට උපයෝගී කරගත් ශිල්ප ක්‍රම වර්ණ භාවිතාව පිළිබඳ විචාරාත්මක විමසුමක් කරන්න. (ල. 10)

## ආ කොටස

## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

## ඉන්දියාව

3. භාරතයේ බෞද්ධ කලා නිර්මාණ අතර සාංචි භාරුත් ස්තූප ආශ්‍රිත කලා නිර්මාණ එරට කැටයම් කලාවේ අභිමානය කියා පෑමට සමත්වේ.

(i) සාංචි තොරණේ බුදුන්ගේ රූපය වෙනුවට යොදාගත් සංකේත හතරක් (04) නම් කරන්න. (ල. 04)

(ii) භාරුත් කැටයම් ශිල්පියා ජාතක කතා නිර්මාණයේ දී බෝසත් චරිතය යොදාගත් අයුරු කෙටියෙන් පහදන්න. (ල. 06)

(iii) සාංචි තොරණ කැටයම් සහ භාරුත් කැටයම් අතර සමාන අසමානතා පිළිබඳ විමසන්න. (ල. 10)

4. ඉන්දු නිම්න වැසියන් ඇදහිලි හා විශ්වාසය පදනම් කරගත් ජීවන රටාවකට හුරුව සිටි පිරිසක් බව ඔවුන්ගේ කලාකෘති අධ්‍යනයෙන් වටහාගත හැකිවේ.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවූ මූර්ති 02ක් නම් කර එහි නිර්මාණ මාධ්‍ය නම් කරන්න. (ල. 04)

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ සැලැස්ම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)

(iii) ඉන්දු නිම්න කලා නිර්මාණවල කලාත්මක ලක්ෂණ හා ආගමික සංකල්පය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 10)

## ඉ කොටස

## චිත්‍ර කලාව හා රසාස්වාදය

## යුරෝපය

5. ''ලෝ පතල ශිෂ්ටාචාරයක් වූ මිසරය හිරු දෙවියන් වන්දනාමාන කරන ප්‍රතාපවත් ජන සමාජයකින් හෙබි අසිරිමත් රාජ්‍යයකි''

(i) මිසර වැසියන් චිත්‍ර ඇඳීමට යොදාගත් වස්තු විෂයයන් 04ක් නම් කරන්න. (ල. 04)

(ii) නාමර් (නර්මේර්) ඵලකය පිළිබඳව කෙටියෙන් ලියන්න. (ල. 06)

(iii) මිසර චිත්‍ර කලාව තුළින් හෙළිවන ඔවුන්ගේ දෛනික ජන ජීවිතය පිළිබඳ සාක්ෂි උදාහරණ සහිතව විමසන්න. (ල. 10)

6. පුනර්ජීවන යුගයේ සිටි ශ්‍රේෂ්ඨ ශිල්පීන් අතර අග්‍රගන්‍ය ප්‍රතිභා පූර්ණ මූර්ති ශිල්පියා මයිකල් ආංජිලෝ ය.

(i) මයිකල් ආංජිලෝගේ කිරිගරුඬ මූර්ති 4ක් ලියන්න. (ල. 04)

(ii) මයිකල් ආංජලෝ අපූර්වතම හා භයානක අත්දැකීම වූයේ සිස්ටියන් දෙව්මැදුරේ චිත්‍ර ඇඳීමයි. සිස්ටියන් දෙව් මැදුරේ අඳින ලද චිත්‍ර හා සම්බන්ධයෙන් කෙටි විස්තරයක් ලියන්න. (ල. 06)

(iii) ලියනාඩෝ ඩාවින්චි කාර්ය බහුල පුද්ගලයෙක් හා ක්ෂේත්‍ර ගණනාවක් නිපුණ පුද්ගලයෙකුය. යුගයේ වෙනත් ශිල්පීන් හා සැසඳීමේදී නිර්මාණ අතලොස්සක් වුවද සම්භාවනීය පුනර්ජීවන යුගයේ ප්‍රතිභාපූර්ණ ශිල්පියෙකි. ඩාවින්චි චිත්‍ර නිර්මාණ ඇසුරින් මෙම කියමන පැහැදිලි කරන්න. (ල. 10)